# පරිගණක මෙහෙයුම් පද්ධතිය

# SFT ප්‍රශ්න සහ පිළිතුරු

A/L Tech කරන හැමෝම ඉන්න ඕනෙ තැනක් **techlogiclk.com**

ජාතික අධ්‍යාපන දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කළ Quiz Bank එකෙහි ඇති ප්‍රශ්න පාඩමෙන් පාඩමට වෙන් කළ සැකසූ PDF එකතුව.

## ඒකකය 08
## පරිගණක මෙහෙයුම් පද්ධති
### බහුවරණ ප්‍රශ්න

1. පරිගණක පද්ධතියක එහි අත්‍යවශ්‍ය ම මෘදුකාංගය එහි මෙහෙයුම් පද්ධතියයි. පහත සඳහන් ඒවායින් මෙහෙයුම් පද්ධතියක් නො වන්නේ කුමක් ද?
   1. Windows 8.1  2. Opera  3. Linux
   4. Fedora  5. DOS

2 Linux මෙහෙයුම් පද්ධතිය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
   A. විධාන රේඛා අතුරු මුහුණත (Command Line Interface) සහිත මෙහෙයුම් පද්ධතියකි.
   B. එය වෙබ් අතිරික්සුවක් ලෙස (Web Browser) ක්‍රියා කරයි.
   C. එය විවෘත කේත (Open Source) වර්ගයට අයත් මෙහෙයුම් පද්ධතියකි.
   ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ?
   1. A පමණි  2. B පමණි  3. C පමණි
   4. A හා B පමණි  5. A හා C පමණි

3. ............................... යනු පරිගණකයේ මතකයට මෙහෙයුම් පද්ධතිය පූරණය (Loading) කිරීමයි.
   1. බූට් කිරීම (Booting)  2. පිටපත් කිරීම (Coping)  3. පැවරීම (Assigning)
   4. සකස් කිරීම (Processing)  5. යවත්කාලීන කිරීම (Upgrade)

4. පරිගණක මතක කළමනාකරණය, කාර්ය කළමනාකරණය සහ ගොනු කළමනාකරණය යන ක්‍රියාවලි පාලනය කරනු ලබන්නේ පහත සඳහන් කුමකින් ද?
   1. සකසනය විසින්  2. සසම්භාවී ප්‍රවේශ මතකය විසින්
   3. මෙහෙයුම් පද්ධතිය විසින්  4. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත විසින්
   5. පරිශීලකයා විසින්

5. චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් (GUI) මෙහෙයුම් පද්ධතියක ගොනු (File) සහ ගොනු බහලුම් (Folder) වැනි වස්තූන් නිරූපණය කිරීමට කුඩා පින්තූරයක් යොදා ගනු ලබයි. මෙම පින්තූර හැඳින්වීමට වඩාත් ම උචිත වන්නේ?
   1. චිත්‍ර (Graphic)  2. නිරූපක (Icon)  3. ඡායාරූප (Photos)
   4. හැඩතල (Shapes)  5. විධාන (Commands)

6. පහත සඳහන් කරුණු සලකා බලන්න.
   A. දෘඩාංග හා මෘදුකාංග අතර සම්බන්ධතාව ඇති කිරීම
   B. වයිරස්වලට එරෙහි ව කටයුතු කිරීම
   C. සෙවුම් යන්ත්‍රයක් ලෙස කටයුතු කිරීම
   D. බාහිර ව සම්බන්ධ කරන උපාංග පාලනය කිරීම (Peripheral Devices)
   ඉහත ඒවායින් මෙහෙයුම් පද්ධතියක කාර්ය / කාර්යයන් වනුයේ ?
   1. A හා B පමණි  2. A හා D පමණි  3. A,B හා D පමණි
   4. A,C හා D පමණි  5. A හා C පමණි

7. මෙම රූපයේ x, y, z ලෙස දක්වා ඇත්තේ?
   1. x-දෘඩාංග, y-යෙදවුම් මෘදුකාංග, z-මෙහෙයුම් පද්ධතිය.
   2. x-මෙහෙයුම් පද්ධතිය, y- දෘඩාංග, z-යෙදවුම් මෘදුකාංග.
   3. x-දෘඩාංග, y-මෙහෙයුම් පද්ධතිය, z-යෙදවුම් මෘදුකාංග
   4. x-මෙහෙයුම් පද්ධතිය, y-යෙදවුම් මෘදුකාංග, z-දෘඩාංග.
   5. x-යෙදවුම් මෘදුකාංග, y-දෘඩාංග, z-මෙහෙයුම් පද්ධතිය.




8. ගොනු (File) සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් සදොස් වන්නේ කුමක් ද?
   1. ගොනුවක ගොනු නාමය (File Name) හා ගොනු දිගුව (File Extension ) ලෙස ප්‍රධාන කොටස් දෙකකි.
   2. පරිගණකයක එක ම නමින් හඳුන්වන ගොනු දෙකක් තිබිය නො හැක.
   3. ගොනු දිගුව මෘදුකාංගයෙන් මෘදුකාංගයට වෙනස් වේ.
   4. ගොනු නාමය සමාන නමුත් ගොනු දිගුව වෙනස් වන ගොනු එක ම ගොනු බහලුමක (Folder) තිබිය හැකි ය.
   5. ගොනුවක ඇති දත්තවල ස්වරූපය අනුව ගොනු දිගුව වෙනස් වේ.

9 ගොනු බහලුම් (Folder) සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ කවර වගන්තිය ද?
1. ගොනු බහලුමක් තුළ තැනිය හැකි උපරිම ගොනු බහලුම් සංඛ්‍යාව 16 කි.
2. ගොනු බහලුමක් සකස් කළ විට දෘඪ තැටියේ ඉඩක් ලබා ගනී.
3. ගොනු බහලුමේ නාමය නැවත නැවත වෙනස් කිරීම කළ හැකි ය.
4. එක ම ආකාරයේ ගොනු තැන්පත් කිරීමට පමණක් ගොනු බහලුම් භාවිත කරයි.
5. ගොනු බහලුම් නාමයකට ද ගොනු දිගුවක් ඇත.

10. පහත දක්වා ඇති මෙහෙයුම් පද්ධති අතරින් විවෘත කේත (Open Source) මෙහෙයුම් පද්ධති වන්නේ මොනවා ද?
A. Windows 8.1
B. Mac OS
C. Ubuntu
D. Linux

1. A හා B පමණි  2. C හා D පමණි  3. B,C හා D පමණි
4. A,C හා D පමණි  5. A හා C පමණි

11. මෙහෙයුම් පද්ධති හැඳින්වීමේ දී GUI යන පදය යොදා ගන්නා අවස්ථා මෙයින් කියවෙන්නේ?
1. Graphical Universal Interface
2. Graphic Unit Indicator
3. Graphical Unit Indicator
4. Graphical User Interface
5. Graphic User Indicator

12. හානිදායක ක්‍රම ලේඛන (Malware) සඳහා උදාහරණයක් වන්නේ?
1. තැටි විභාගීකරණය (Disk Deferagmenters )
2. නිදොස්කරණය (Debuggers)
3. ස්ථිරාංග (Firmware )
4. ට්‍රෝජන් අශ්වයින් (Trojan Horse)
5. ඇසෙම්බ්ලි භාෂාව (Assembly Language)

13. Windows Explorer මගින් කිසියම් බහලුමක් විවෘත කළ විට එහි ලිපින තීරුවේ C:\SC_TEC ලෙස සටහන් ව තිබිණි. මෙහි C ලෙස දක්වා ඇත්තේ
1. පරිගණකයේ ප්‍රධාන ගොනු බහලුමයි.
2. SC_TEC ගොනු බහලුමේ නමෙහි කොටසකි.
3. ධාවකයකි.
4. සසම්භාවී ප්‍රවේශ මතකයේ දත්ත රැඳී ඇති එක් ස්ථානයක නම වේ.
5. SC_TEC ගොනු බහලුම ඇතුළත් කොට ඇති ගොනු බහලුමයි.

14. පරිගණකයක් මද වේලාවක් භාවිත නො කර සිටින විට දී එහි තිරය මත චලනය වන රේඛා සහිත චිත්‍රයක් දක්නට ලැබේ. මෙය හඳුන්වනු ලබන්නේ,
1. Screen Capture
2. Screen Saver
3. Screen Resolution
4. Screen Art
5. Screen Theme

15. ශිෂ්‍යයෙක් තම ජංගම දුරකථනය භාවිත කොට ඡායාරූපයක් ලබා ගනී. එය පරිගණකයේ ගොනුවක් ලෙස ගබඩා කර තැබීමට භාවිත කළ නො හැකි ගොනු නාමය වන්නේ?
1. BMP ගොනු  2. JPG ගොනු  3. PPT ගොනු
4. TIF ගොනු  5. GIF ගොනු

16. DOS යනු ඉතා අඩු ඉඩක් වැය වන පරිගණකවලට මූලික ව අවශ්‍ය වූ මෘදුකාංගකි. මෙහි DOS යනුවෙන් හඳුන්වන්නේ?
1. Data Operational Security
2. Disk Operation Security
3. Disk Optical Security
4. Disk Operating System
5. Data Operational System

17. සිසුවෙකු යෙදුම් මෘදුකාංගයක් භාවිත කරමින් සිටින විට එය අක්‍රීය විය. (Stuck) එවිට මෙම වැඩ සටහන වසා දැමීමට "Task Manager " වින්ඩෝව ලබා ගැනීමට භාවිත කළ යුතු යතුරු සංකලනය වන්නේ?
   1. Alt + Ctrl + T
   2. Alt +Ctrl + Delete
   3. Ctrl + Alt + End
   4. Alt + Ctrl + F4
   5. Ctrl + Alt + Backspace

18 DOS Prompt හි දී dir /P විධානය ක්‍රියාත්මක කිරීමෙන්
   1. P යන ධාවකයට මාරු විය හැකි ය.
   2. දැනට සිටින ගොනු බහලුමේ ඇති ගොනුවල (File) නම් ලැයිස්තුව බලා ගත හැකි ය.
   3. දැනට සිටින ගොනු බහලුමේ ඇති උප බහලුම්වල (Sub Directories) නම් ලැයිස්තුව බලා ගත හැකි ය.
   4. දැනට සිටින ගොනු බහලුම තුළ ඇති ගොනු (File) සහ උප බහලුම්වල (Sub Directories) නම් ලැයිස්තුව බලා ගත හැකි ය.
   5. ක්‍රියාත්මක වන ගොනුවෙන් ඉවත් විය හැකි ය.

19. C:\SFT> මෙලෙස Dos Promopt එක තිබෙන අවස්ථාවක දී CD tech යන විධානය ලබා දීමෙන්,
   1. SFT ගොනු බහලුමේ සිට C ධාවකයේ ඇති tech(C:\tech>) ගොනු බහලුමට මාරු විය හැකි ය.
   2. SFT ගොනු බහලුම තුළ ඇති Tech උප ගොනු බහලුමට (Sub Directory) මාරු විය හැකි ය.
   3. Dos Prompt එක C:\Tech> ලෙස වෙනස් වේ.
   4. C ධාවකය තුළ Tech නමින් ගොනු බහලුමක් නිර්මාණය වේ.
   5. SFT ගොනු බහලුම් නම Tech ලෙස නැවත නම් කරයි.

20. එක් ගොනු බහලුමක සිට වෙනත් ගොනු බහලුමක් වෙත ගොනු විතැන් කිරීමට යොදා ගන්නා කෙටි මං යතුරු වන්නේ?
   1. Ctrl + C සහ Ctrl + V
   2. Ctrl + Z සහ Ctrl + X
   3. Ctrl + X සහ Ctrl + V
   4. Ctrl + A සහ Ctrl + V
   5. Ctrl + C සහ Ctrl + P

21. සිසුවෙක් තම හඬ පරිගණකයට පුහුණු කොට විධාන දීමට අපේක්ෂා කරයි. මේ සඳහා ඔහු පිවිසිය යුත්තේ?
   1. Control Panel තුළ ඇති Sound Recoder වෙත ය.
   2. System Tools තුළ ඇති Speech Recognition වෙත ය.
   3. Control Panel තුළ ඇති Speech Recognition වෙත ය.
   4. System Properties තුළ ඇති Sound Recognition වෙත ය.
   5. Control Panel තුළ ඇති Sound configuration වෙත ය.

22. පරිගණකයේ ගොනු බහලුමක ඇති A නමැති ගොනුව සහ Flash Drive හි ඇති B ගොනුව Delete යතුර භාවිත කොට මකා දැමීමේ දී සිදු වන ක්‍රියාවලිය වන්නේ?
   1. A සහ B ගොනු දෙක ම මැකීයාම.
   2. A සහ B ගොනු දෙක ම Recycle Bin වෙත යාම.
   3. A Recycle Bin වෙතත් B මැකීයාමත් සිදු වේ.
   4. B Recycle Bin වෙතත් A මැකීයාමත් සිදු වේ.
   5. A සහ B ගොනු දෙකේ ම උපස්ථ පිටපත් සෑදේ.

23. පරිගණකය තුළ ඇති ගොනුවක් ස්ථිර ලෙස මකා දැමීමට භාවිත කරන කෙටි මං යතුරු වනුයේ?
   1. Ctrl + Delete
   2. Shift + Delete
   3. Alt + Delete
   4. Ctrl + Alt + Delete
   5. Win key + Delete

24. ඔබගේ මිතුරකු ඔහුගේ පරිගණකයේ කවුළු (Window) ඔබගේ පරිගණකයට වඩා විශාල ව දක්වන බව පවසා එය නිවැරදි කර ගැනීමට ඔබගේ උපදෙස් පතයි නම්, ඔබ ඔහුට දෙන උපදේශය වන්නේ?
   1. පරිගණකයේ තිරය සකස් කර ගැනීමට ය.
   2. පරිගණකයේ තිර විභේදනය (Resolution) වෙනස් කර ගැනීමට ය.
   3. කවුළු නැවත සකස් කිරීම (Resize)
   4. මෙහෙයුම් පද්ධතිය නැවත ස්ථාපනය කිරීම.
   5. වෙනත් මොනිටරයක් සවි කර බැලීමට ය.
25. පහත දී ඇති ඒවායින් අවශ්‍ය ගොනු මකා නො දමා දෘඪ තැටියේ ඉඩ වැඩි කර දෙනු ලබන්නේ?
   A. Defragmentation
   B. Disk Clean up
   C. Backup

   1. A පමණි 2. B පමණි 3. A හා B පමණි
   4. B හා C පමණි 5. A,B හා C සියල්ල ම
26. Kaspersky, AVG, McAfee යනු පහත සඳහන් කවර වර්ගයට අයත් මෘදුකාංග වේ ද?
   1. මෙහෙයුම් පද්ධති මෘදුකාංග වේ. (Operating System)
   2. වදන් සැකසුම සඳහා වු මෘදුකාංගය වේ. (Word Processing)
   3. ප්‍රති වෛරස් මෘදුකාංග වේ. (Anti-Virus)
   4. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන මෘදුකාංග වේ. (Desktop Publishing)
   5. නාශක මෘදුකාංග වේ. (Malware)
27. මෙහෙයුම් පද්ධතියක කාර්යයක් <u>නො වන්නේ</u> ?
   1. මතක කළමනාකරණය (Memory Managment)
   2. උපක්‍රම කළමනාකරණය (Device Managment)
   3. ශබ්ද කළමනාකරණය (Sound Managment)
   4. ක්‍රියාවලි කළමනාකරණය (Process Managment)
   5. ගොනු කළමනාකරණය (File Managment)
28. පහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ?
   A. මෙහෙයුම් පද්ධතියක්, යෙදුම් මෘදුකාංග ගණයට අයත් වෙයි.
   B. Mac OS විවෘත කේත මෙහෙයුම් පද්ධතියකට උදාහරණයකි.
   C. මෙහෙයුම් පද්ධතියක් මගින් දෘඩාංග හා මෘදුකාංග කළමනාකරණය කරයි.

   1. A පමණි 2. A හා B පමණි 3. B හා C පමණි
   4. C පමණි 5. A හා C පමණි
29 රූපයක විභේදනය (Resolution) මගින් මනිනු ලබන්නේ
   1. එහි ඇති Pixel ප්‍රමාණයයි.
   2. එහි ඇති වර්ණ ගණනයි.
   3. එහි ඇති දීප්තිමත් භාවයයි.
   4. අඳුර සහ ආලෝකය අතර අනුපාතයයි.
   5. රූපවල ප්‍රමාණයයි.
30. පරිගණකයේ කාර්ය සාධනය (Performance) ඉහළ නැංවීමට උපකාරි වන මෘදුකාංග හඳුන්වනු ලබන්නේ?
   1. මෙහෙයුම් පද්ධතිය.
   2. පද්ධති මෘදුකාංග (System Software)
   3. යෙදවුම් මෘදුකාංග (Application Software)
   4. උපයෝගීතා මෘදුකාංග (Utility Software)
   5. කාර්ය සාධන මෘදුකාංග (Performance Software)
31. පරිගණකයට මුරපදයක් (Password) යෙදීමේ අරමුණ වන්නේ?
   1. වෛරස්වලින් පරිගණකය ආරක්ෂා කිරීමට ය.
   2. සෑම කෙනෙකුට ම සමාන අවස්ථා ලබා දීමට ය.
   3. අන්තර්ජාලයට පහසුවෙන් පිවිසීමට ය.
   4. ආරක්ෂක උපක්‍රමයක් ලෙස භාවිතය සීමා කිරීමට ය.
   5 සොරුන්ගෙන් පරිගණකය බේරා ගැනීමට ය.

32. පරිගණකයට වෛරස් ඇතුළු වීමට බලපෑ හැකි හේතුවක් නො වන්නේ?
    1. පරිගණක පොදුවේ භාවිතය.
    2. ප්‍රතිවයිරස් මෘදුකාංගය යවත්කාලීන නොකිරීම.
    3. නොදන්නා කෙනෙකුගෙන් ලද විද්‍යුත් තැපැල් විවෘත කිරීම.
    4. චෞර (Pirated) මෘදුකාංගයක් භාවිත කිරීම.
    5. ඉහත කිසිවක් නොවේ.
33. පරිගණකයේ ක්‍රියාකාරිත්වයට ඍජු බලපෑමක් කළ හැකි වන්නේ?
    1. වයිරස් වැඩසටහන්වලට ය.
    2. ට්‍රෝජන් (Trojen Horse) වැඩසටහන් වලට ය.
    3. ඔත්තුකාර (Spyware) වැඩසටහන් වලට ය.
    4. ඉහත සඳහන් සියල්ල ම.
    5. ඉහත කිසිවකට නොවේ.
34. විවෘත ව ඇති විවිධ වැඩසටහන් අතර මාරු වීමට යොදා ගන්නා කෙටි මං යතුරු සංයෝජනය කුමක් ද?
    1. Alt + TAB   2. Ctrl + TAB   3. Alt + Shift
    4. Ctrl + Shift   5. CAlt + W

---

**බහුවරණ - (පිළිතුරු)**

| | | | |
|---|---|---|---|
| 1-2 | 11-4 | 21-3 | 31-4 |
| 2-3 | 12-4 | 22-3 | 32-1 |
| 3-1 | 13-3 | 23-2 | 33-4 |
| 4-3 | 14-2 | 24-2 | 34-1 |
| 5-2 | 15-3 | 25-3 | |
| 6-2 | 16-4 | 26-3 | |
| 7-3 | 17-2 | 27-3 | |
| 8-2 | 18-4 | 28-4 | |
| 9-3 | 19-2 | 29-1 | |
| 10-2 | 20-3 | 30-4 | |